# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,935/7 — 1970 දෙසැම්බර් 11 වැනි සිකුරාදා — 1970.12.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

## තනතුරු—ඇබෑර්තු

### රජයේ ලිපිකරු සේවාවන්ට බඳවා ගැනීම

1970 නොවැම්බර් මස 20 වෙනි දින අංක 14,933/1 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති රජයේ ලිපිකරු සේවාවන්ට බඳවා ගැනීම පිළිබඳ නිවේදනයට කර ඇති පහත සඳහන් සංශෝධන පොදු දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(අ) දැනට ඇති 8 (II) ඡේදය කපාහැර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ඇතුළත් කරන ලදී :—

" **8 (II) වයස.**—අපේක්ෂක/අපේක්ෂිකාවෝ 1970 නොවැම්බර් 1 වැනි දිනට වයස අවුරුදු 17 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 28ට නොවැඩි විය යුත්තාහ.

**සටහන (i).**—සාමාන්‍යයෙන් පවතින වැඩිම වයස් සීමාව වූ අවුරුදු 23 අවුරුදු 28 දක්වා ඉහළ නංවන ලද්දේ මෙවර පවත්වන බඳවා ගැනීම සඳහා පමණක් ය.

**සටහන (ii).**—දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂක/අපේක්ෂිකාවෝ (ස්ථිර/තාවකාලික/අනියම් වුවද) 1970 නොවැම්බර් 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු නම් ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති. 1970 නොවැම්බර් 1 වැනි දින වන විට ස්ථිර සේවයේ යෙදී සිටින අපේක්ෂක/අපේක්ෂිකාවන් හට අවම සේවා සුදුසුකම් අවශ්‍ය නොවේ. එහෙත් තාවකාලික සේවකයන් විසින් 1970 නොවැම්බර් 1 වැනි දිනට මත්තෙන් ඒ එක්කම කාලය තුළ යටත් පිරිසෙයින්, රජය යටතේ අවුරුද්දක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුය. අනියම් සේවකයන් සම්බන්ධයෙන් 1970 නොවැම්බර් 1 වැනි දිනට මත්තෙන්, ඒ එක්කම කාලය තුළ එකතු වූ සම්පූර්ණ අවුරුද්දක සේවා කාලයක් වත් යටත් පිරිසෙයින් ඔවුන්ට තිබිය යුතුය."

(ආ) දැනට ඇති 12 (iv) ඡේදය කපාහැර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ඇතුළත්කරන ලදී :—

" 12. (iv) අයැදුම් පත් 1971 ජනවාරි මස 6 වැනි දින හෝ එදිනට පෙර, කොළඹ 7, තැ. පෙ. 1699, රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන කවර හෝ අයැදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටම රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින්ද ඔවුන්ගේ අයැදුම් පත් කෙලින්ම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. " රජයේ ලිපිකරු සේවාවන්ට බඳවා ගැනීම " යන වචන ලියුම් කවරයෙහි වම් පැත්තේ ඉහළ කෙලවරේ පැහැදිලිව ලිවිය යුතුය."

2. බඳවා ගැනීම පිළිබඳ අනිකුත් නීති-රීති නො වෙනස්ව පවතිනු ඇත.

එච්. එස්. වනසිංහ,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව (ඒකාබද්ධ සේවා අංශය),
තැපැල් පෙට්ටිය 1699, කොළඹ 7,
1970 දෙසැම්බර් 11 වෙනි දින.

12—715


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි

1724/1—ජේ 19260—18,300 (70/12)